**ශීර්ෂය 110 - අධිකරණඅමාත්‍යාංශය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

අධිකරණඅමාත්‍යාංශයේ2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණඅමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරිවෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 20 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020දෙසැම්බර් 31 දිනට අධිකරණඅමාත්‍යාංශයේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේවගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීසහතික වියයුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.6.2 | 1998 වර්ෂයේ නොපිය වූ රු.4,809,450 ක අග්‍රිම ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් හා ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි. | නොපිය වූ රු.4,809,450 ක අග්‍රිම ශේෂයඅග්‍රිම ගිණුමේ දැක්විය යුතුවේ. |
| 1.6.3 | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. | බැරකම් ලේඛනය පවත්වාගෙන ගෙනයායුතුවේ. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණ ගිණුම හා එහි සංචිත ගිණුම රු.72,419,848ක් වැඩියෙන් දක්වා තිබුණි. | පද්ධති දෝෂයක් හේතුවෙන් දේපළ පිරියත හා උපකරණ වටිනාකමරු.72,419,848ක් වැඩියෙන් සටහන් වී ඇත. මෙම වර්ෂයට අදාල අවසන් ගිණුම් සකස් කිරීමේදී මෙම වෙනස නිවැරදි කිරීමට අවශ්‍යකටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම් දැක්විය යුතුවේ. |
| (ආ) මූල්‍ය නොවන වත්කම්වලඉකුත් වර්ෂයේ අවසාන ශේෂය, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ගැනීමේදී රු.4,994,826,477 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පද්ධතියේ දෝෂයක් හේතුවෙන් **CIGAZ INTERFACE**හි වත්කම් වටිනාකම් වෙනස් වී ඇති අතර එය නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දුන් අතර එය ඉදිරියේදී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන බව එම දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. | ඉකුත් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල . අවසාන ශේෂ, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ගත යුතුවේ. |

**1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට කේවල ණය ශේෂ වටිනාකම හා සාමාජික ණය ලේඛන අතර ණය ශේෂ 19 ක රු.616,127 ක වෙනසක් නියැදි විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. | මෙම නිලධාරීන්ගේ ණය ශේෂ, කේවල ණය ලේඛනයට පිටපත් කිරීමේදී අතපසු වීමකින් වාරිකයන් මඟහැරී ඇති අතර මේ වන විට එම වරද නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | සාමාජික ණය ලේඛනයේ ශේෂ නිවැරදිව, කේවල ණය ශේෂ ලැයිස්තුවට පිටපත් කළ යුතුවේ. |

**1.6.3 තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රඳවාගත් තැන්පතු වටිනාකම භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු පොත් සහ තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශයඅතර වෙනස රු.1,608,554 ක් වූයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් හා ශුද්ධ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන කට්ටල පිළියෙල කිරීමේදී සිදු වු වාර්තා කිරීමේ දෝෂයක් හේතුවෙන් රු.1,608,554 ක මුදලක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. | භාණ්ඩාගාර පොත් අනුව වටිනාකම ගිණුම් ගතකල යුතුවේ. |

**1.6.4 අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොඩනැගිල්ලක 2021 වර්ෂයට අදාලව ගෙවන ලද රු.3,180,000 ක කුලිය, කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමට හා සංචිත ගිණුමට ගිණුම්ගත කර තිබුණදභාණ්ඩාගාර පොත්වල ඇතුළත් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන භාණ්ඩාගාර පොත් සමඟ සැසඳී නොතිබුණි. | අංක 250/2016(i) දරනරාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව වැය විෂයය 1404 යටතේ හැර අනෙකුත් වැය විෂයන් යටතේ කුලී අත්තිකාරම් සංචිත ගිණුම් ආරම්භ කිරීමට අවස්ථාව ලබා නොදේ. විශේෂ ඒකකයේවියදම් සඳහා 110-01-02-.2509-21 වැය විෂයය යටතේ ප්‍රතිපාදන ලබාදී තිබූ බැවින් කුලී අත්තිකාරම් සංචිත ගිණුම් ආරම්භ කිරීමට හැකියාවක් නොමැත. එබැවින් මෙම වටිනාකම භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල ඇතුළත් වී නොමැත. | 2016 අගෝස්තු 03 දිනැති අංක 250/2016 (I) දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

### 1.6.5 ලේඛන හා පොත්පත් යාවත්කාලීනවපවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේ සිදු වූ එක් අනතුරක් හා 2020 වර්ෂයේ සිදු වූ අනතුරු 06 ක් හානි හා පාඩු ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | එම වාහන අනතුරුසම්බන්ධවහානි තක්සේරු කර ඇති අතර මු. රෙ. 104 විමර්ෂණකටයුතුසිදුකරමින්පවතිනබැවින්එමපරීක්ෂණඅවසන්වනිර්දේශලදපසුකිසියම් අලාභයන්වෙතොත්වගකිවයුතුපාර්ශවයන් ගෙන්අයකරගැනීමටත් හානි පාඩු ලේඛණයට ඇතුළත් කර එය යාවත්කාලීන කර පවත්වා ගෙන යාමටත් කටයුතු කරනු ලැබේ. | හානි හා පාඩු ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාණ්ඩාගාර බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ 2018 හා 2019 වර්ෂවල නිරවුල් නොකරන ලද එකතුව රු.628,650 ක් වූ ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අංක **SA-92**ආකෘතියෙහි පෙන්නුම් කරන2018 හා 2019 වර්ෂයට අදාල මෙම වටිනාකම් පද්ධති දෝෂයක් හේතුවෙන් ඇතුළත් වී ඇති අතර මෙම මුදල තවදුරටත් ගෙවිය යුතු වටිනාකමක් නොවේ.මෙම මුදල අතපසුවීමකින් බැදීම් හා බැරකම් ප්‍රකාශයේ ඇතුළත් කර ඇත. | භාණ්ඩාගාර ශේෂය නිවැරදි කරවා ගත යුතුවේ. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) මුදල් රෙගුලාසි 104 (1) | 2017,2018, 2019 හා 2020 වර්ෂවලදී සිදු වූ වාහන අනතුරු 04 කට අදාළ හානිය 2020 දෙසැම්බර් 31 දින වනවිටත්තක්සේරු කර නොතිබුණි. | මෙහි මු.රෙ.104 පරීක්ෂණ සිදු වෙමින් පවතින අතර එම පරීක්ෂණ කමිටු වල නිර්දේශ සහ මු. රෙ. 104 (3) අවසාන පරීක්ෂණ වාර්තාවේ නිශ්චය කරනු ලබන අලාභයන් සඳහා වගකිව යුතු යම් පාර්ශවයන් වෙතොත් ඊට අදාළ අයකර ගැනීම් සිදු කිරීමට අදාළ නිසි පියවර ගනු ඇත | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) මුදල් රෙගුලාසි 109 (1) හා (2) | 2012 සිට 2020 දක්වා අවස්ථා 10 කදී සිදු වී තිබුණු අලාභ හා හානි සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම අනතුරු වලට අදාළ මු. රෙ. 104 පරීක්ෂණය සිදු වෙමින් පවතින අතර එම පරීක්ෂණ කමිටු වල නිර්දේශ සහ මු. රෙ. 104 (3) අවසාන පරීක්ෂණ වාර්තාව මඟින් නිශ්චය කරනු ලබන අලාභයන් සඳහා වගකිව යුතු යම් පාර්ශවයන් වෙතොත් ඊට අදාළ අය කර ගැනීම් සිදු කර ගැනීමට අදාළ නිසි පියවර ගනු ඇති අතර හානි හා පාඩු ලේඛනයෙන් කපා හැරීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩ තහනමට ලක්වූ නිලධාරීන්/ සේවකයන් හා සේවය හැරගිය නිලධාරීන් 07 දෙනෙකුගේ එකතුව රු.624,602 ක ණය ශේෂ වසර 06 සිට 23 දක්වා කාල පරාසයක සිට අය නොවී පැවතුණි. | වැඩ තහනමට ලක්වූ පී.වී.ගුණවර්ධන - රු.162,215නීතිපති දෙපාර්තමේන්තුව මඟින් නඩු පවරා ඇති බවත්, ජී.ඒ.සී.ගමආරච්චි- රු.118,932නැවත සේවයේ පිහිටුවූවද සේවය භාර ගෙන ඇති බව තහවුරු කර ගැනීමට නොහැකි වී ඇති බැවින් තවදුරටත් සොයා බලා ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කරන බවත්,එම්.අයි.ප්‍රනාන්දු-රු.49,150නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතින බවත්, සේවය හැරගිය<br>කේ.එම්.එස්.ප්‍රනාන්දු-<br>රු.31,280සහඑච්.ආර්.පෙරේරා - රු.31,730යන ණයකරුවන්ගේ හෝ ඇපකරුවන්ගේ හෝ තොරතුරු නොමැති වීම නිසා මු.රෙ.109 යටතේ කපා හැරීමට යොමු කලද තොරතුරු ප්‍රමාණවත් නොවීම නිසා ආපසු එවා ඇති අතර එච්.එස්.සී.පුෂ්පකුමාර-රු.121,392සහඑච්.ඒ.ඒ.චාමර-රු.117,003 සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 2.4 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ සමඵ දින වියදම් පියවීම සඳහා **UNDP** ආයතනයෙන් 2017 වර්ෂයේ ලැබී තිබුණු රු.1,316,041 ක මුදල් අදාළ අරමුණට නොයොදා තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | 2016 නොවැම්බර් සමඵ දිනය වෙනුවෙන් වියදම් දැරීම සඳහා **UNDP** ආයතනයෙන්ලැබීඇත.එමමුදලවෙනත් ව්‍යාපෘතියක්සඳහාඋපයෝජනයකිරීමට **UNDP** ආයතනයෙන් එකඟතාවය විමසීම් කර ඇති අතර එය ලද පසු ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | ලැබුණු මුදල් අදාල කාර්යයට යෙදවිය යුතු අතර එසේ නොවේ නම් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රතිසන්ධානය මූලික කරගත් ආර්ථිකය සවි බල ගැන්වීමේ හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙන් සැලසුම් කර තිබුණු බදුල්ල දිස්ත්‍රික්කයේ රු.3,005,961 ක් වටිනා ව්‍යාපෘති 05 ක් ද මන්නාරම දිස්ත්‍රික්කයේ රු.මිලියන 27.92 ක් වටිනා ව්‍යාපෘති 28 ක් දක්‍රියාත්මක කර නොතිබුණි. | බදුල්ල දිස්ත්‍රික්කයේ සැලසුම් කර තිබූඑක් මාර්ගසංවර්ධන ව්‍යාපෘතියක්මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කිරීමත් එක්ව්‍යාපෘතියක්සඳහාමාර්ගය දෙපස පදිංචිකරුවන් විරෝධතා දැක්වීමත්. ව්‍යාපෘති 2ක් සඳහාසංශෝධන අනුමත කර ක්‍රියාත්මක කිරීමට කාලය ප්‍රමාණවත් නොවීමත්, එක් ව්‍යාපෘතියක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාදීම ප්‍රමාද වීමත් නිසා ක්‍රියාත්මක නොවීය.මන්නාරම් දිස්ත්‍රික්කයේ. රු.මි.27.92 ක් වූ ව්‍යාපෘති 28 කවියදම් ඇස්තමේන්තු කැඳවීම පමණක් සිදු කර ඇති අතර එම ව්‍යාපෘති අනුමත කිරීමක් සිදු කර නොමැත. | සැලැසුම් කල පරිදි ව්‍යාපෘතික්‍රියාත්ම කකිරීමට කටයුතු කළ යුතුවේ. |

### 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මන්නාරම දිස්ත්‍රික්කයේ මඩු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ඇස්තමේන්තු වටිනාකම රු.10,200,000 ක් වූ සංවර්ධන සහයෝගීතා වැඩසටහන් 12 ක් 2019 දෙසැම්බර් 31 දින වන විට නිම කළ යුතුව තිබුණ ද, 2020 අගෝස්තු 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. මෙම ව්‍යාපෘති වෙනුවෙන් රු.3,188,533 ක් වැය කර තිබූ අතර එහි මූල්‍ය ප්‍රගතිය සියයට 10 ත් සියයට 58 ත් අතර අඩු මට්ටමක තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් එහි වැඩ කොටසක් පමණක් ඉටු කිරීමට හැකි වී ඇත. | සැලැසුම් කල පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුවේ. |

## 3.3 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 වගන්තියඅනුව හදිසි ප්‍රසම්පාදන සම්බන්ධ විධිවිධාන අනුගමනය නොකර කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිල්ලක වර්ග අඩි 2000 ක බිම් මහලක් රු.265,000 ක මාසික කුලියකටඅවුරුදු 02 ක් බදු කුලී පදනම මත ගෙන සමාලෝචිත වර්ෂයේ වර්ෂයක කුලිය ලෙස රු.3,180,000 ක් හා ආරක්ෂක තැන්පතු ලෙස රු.795,000 ක් ගෙවා තිබුණි. | විශේෂ ඒකකය පිහිටුවීම සඳහා අමාත්‍යාංශ පරිශ්‍රයේ ඉඩ පහසුකම් නොතිබූ බැවින්ද ඒ සඳහා පවරන ලද කාර්යයන් නියමිත කාලය තුළ සම්පූර්ණ කළයුතු බැවින්ද එහි අධීක්ෂණය, සම්බන්ධීකරණය, පසු විපරම් කිරීම සිදු කළයුතු වූ බැවින් එය අමාත්‍යාංශය ආසන්නයේ පිහිටුවීම අවශ්‍යවූ අතරදවස ගොඩනැගිල්ලේ බිම් මහල කුලියට ලබා ගන්නා ලදි. එහෙත් 2020 දෙසැම්බර් 01 දින ශ්‍රේෂ්ඨාධිකරණයට හා අභියාචනාධිකරණයට නව විනිසුරුවන් පත් කිරීම නිසා ඊට ඉඩකඩ ලබාදියයුතු වූ බැවින් අභ්‍යන්තර විගණන අංශය තාවකාලිකව දවස ගොඩනැගිල්ලෙහි ස්ථාපනය කර ශ්‍රේෂ්ඨාධිකරණයට හා අභියාචනාධිකරණයට අවශ්‍ය ඉඩ පහසුකම් ලබාදුන් අතර මේ වන විට විශේෂ ඒකකය එම ස්ථානයේ පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයඅනුගමනයකළ යුතුවේ. |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) එකතු වටිනාකම රු.17,250,000 ක් වූ වාහන 5 ක් වසර 01 ත් 02 ත් අතර කාල පරාසයක් නිශ්ක්‍රීයව තිබුණි. | අංක WP KI 0239 දරන රථය අලුත්වැඩියාව ආර්ථික වශයෙන් ඵලදායී නොවන බැවින් අපහරණය සඳහා කටයුතුසිදු කෙරෙමින් පවතී. අංක WP JY 9936 සහ WP KB 0928 දරන වාහන අලුත්වැඩියා සඳහා යොමුකර ඇති අතර අලුත්වැඩියාව අවසන්වූ පසු ධාවනයට යොමු කරනු ඇත. අංක WP KE සහ 5456WP KR 2300 දරන රථයන් යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ නිර්දේශය පරිදි අලුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවා ඇති අතර අලුත්වැඩියා කටයුතු සිදුකර අවසන්වූ පසු ධාවනයට යොමු කරනු ඇත. | අලුත්වැඩියා කර පාවිච්චියට ගැනීමටත් පාවිච්චියට ගත නොහැකි වාහන සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගගැනීමත් කළයුතු වේ. |
| (ආ) 2019 හා 2020 වර්ෂවල වෙනත් ආයතන වලින් භාරගෙන තිබුණු එකතු වටිනාකම රු.21,900,000 ක් වූ වාහන 04 ක අයිතිය 2020 දෙසැම්බර් 31 දින වනවිටත් විධිමත්ව භාර ගැනීමට හෝ භාර දීමට හෝ කටයුතු කර නොතිබුණි. | මෙම වාහන අදාල ආයතන වෙත විධිමත්ව භාර දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | විධිමත්ව භාරගැනීමට හෝභාර දීමට කඩිනමින් කටයුතු කළයුතු වේ. |
| (ඇ) වෙළඳපල වටිනාකමරු.5,000,000 ක් වූ කැබ් රථයක් 2017 වර්ෂයේඅනතුරකට පත් වී 2019 වර්ෂයේ අධිකරණ අමාත්‍යාංශයට ගෙනවිත් දමා තිබුණි. අමාත්‍යාංශයටවාහනය විධිමත්ව භාරදීමකින් තොරව මෙම වාහනය පරිහරණය කළ පාර්ශවය 2018 වර්ෂයේ | මෙම අනතුරට අදාළව මු. රෙ. 104 පරීක්ෂණය මේ වන විට සිදු කෙරෙමින් පවතින අතර එම පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ සහිත මු. රෙ. 104 (3) අවසාන වාර්තාව ලද පසු අලාභ අය කර ගැනීම සහ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අදාළ ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | පරීක්ෂණ කඩිනමින් අවසන් කළ යුතුවේ. |

තනතුරෙන් ඉවත්ව තිබුණි. අනතුර සම්බන්ධයෙන් 2017 ජුනි 07 දින පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව, පොලිස් පැමිණිල්ලේ පිටපත, රියදුරුගේ ප්‍රකාශය ගොනුවේ නොතිබුණු අතර2021 පෙබරවාරි වන විටත් වාහනය අළුත්වැඩියා කිරීමට හෝ අනතුරට වගකිව යුතු පාර්ශවය හඳුනාගෙන රජයට වූ අලාභය අයකර ගැනීමට හෝ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.5 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය විසින් ආයතනයේ තොරතුරු මහජනයා වෙත ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර තිබුණත්, එම වෙබ් අඩවිය මගින් මහජනයාගේ අවශ්‍යතාවයන්, ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රශංසා පලකිරීමට පහසුකම් සලසා නොතිබුණි. | අමාත්‍යාංශය විසින් ආයතනයේ තොරතුරු මහජනයා වෙත ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර ඇති අතර එම වෙබ් අඩවිය මඟින් මහජනයාගේ අවශ්‍යතාවයන්,ආයතනය පිළිබඳ යෝජනා හෝ ප්‍රශංසා පළ කිරීමට පහසුකම් සලසා දීම සඳහා වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | අදාළ පහසුකම් සලසා තිබිය යුතුවේ. |
| (ආ) | 2017 සිට 2020 දක්වා කාලය තුළ ගොනු කර තිබූ කාර්ය මණ්ඩලය විනය පරීක්ෂණ 93 කින් 2021 මාර්තු වන විට විනය පරීක්ෂණ 52ක් අවසන් කර නොතිබුණු අතර 2017 වර්ෂයට පෙර ගොනු කරන ලද අවසන් නොවූ විනය පරීක්ෂණද විය. | මූලික විමර්ශන අවසන් කර නොමැති ගොනු 33 කට අදාළ විමර්ශන අවසන් කර වාර්තා කඩිනමින් ඉදිරිපත් කරන ලෙසට දන්වා යැවීමටත්, විධිමත් විනය පරීක්ෂණ ආරම්භ කර ඇති ගොනු 07ට අදාළව නොයෙක්ගැටළු හේතුවෙන් ප්‍රමාද වීම් සිදු වී ඇත. | විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් නිමකල යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | අධිකරණ ක්‍රියා මාර්ග අවසන් වන තෙක් හෝ අධිකරණ වෙතින් තොරතුරු ලැබෙන තෙක් ගොනු 11 ක් නවතා ඇත. එම ක්‍රියා මාර්ගවලින් අනතුරුව ගොනු සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | |
| (ඇ) | ජාත්‍යන්තර වාණිජ ගිවිසුම් සහ වෙනත් ජාත්‍යන්තර සබඳතා ආශ්‍ර යෙන් පැන නඟින ආරවුල් නිරාකරණය සඳහා කලාපීය මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකා ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානයක් ඇති කර එය ස්ථිර ස්ථානයක ස්ථාපිත කරන තෙක් 2013 වර්ෂයේ සිට කුලී පදනම මත ලබාගත් ස්ථානයක පවත්වාගෙන ගොස් තිබුණු අතර 2016 දී ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ස්ථාපිත කර ඇති නමුත් සමාගමට අවශ්‍ය මූලධනය සපයාදීම සම්බන්ධයෙන් තීරණයක් ගෙන නොමැති වීම හා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොමැතිවීම යන හේතු නිසා එම සමාගම අක්‍රීයව පැවැතුණි. සමාලෝචිත වර්ෂයේ දී 2019 ජුලි සිට 2020 දෙසැම්බර් දක්වා කුලිය ලෙස රු.41,702,018 ක් ද පරිපාලන වියදම් රු.64,800 ක් ද, ආපසු ගෙවන ආරක්ෂක තැන්පතුව රු.273,420 ක් ද වශයෙන් රු.42,040,238 ක් ගෙවා තිබුණත් මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණ ඉටුකර ගෙන නොතිබුණි. | දැනට මෙම ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය පවත්වා ගෙන යන පරිශ්‍රය විවිධ ආයතනයන්හි ඉල්ලීම මත දෛනික කුලී පදනම මත ලබාදීම සිදු කරනු ලබන අතර කොළඹ නව අධිකරණ සංකීර්ණය ඉදිකිරීමෙන් අනතුරුව ස්ථිර වශයෙන් එහි පිහිටුවීමට කටයුතු කරනු ලැබේ. | මෙම පරිපාලන ගැටළුව කඩිනමින් නිරාකරණය කර, පිහිටුවීමේඅරමුණ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 11 ක නිලධාරීන් 19 දෙනෙකුගේ ද, තෘතියික මට්ටමේ එක් තනතුරක නිලධාරීන් දෙදෙනෙකුගේද, ද්වීතියික මට්ටමේ තනතුරු 0**3** ක නිලධාරීන් **33** දෙනෙකුගේද ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 ක සේවකයින් 05 දෙනෙකුගේද පුරප්පාඩු පැවතුණි. | මෙම පුරප්පාඩු සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කර ඇත. | අත්‍යාවශ්‍යව පවතින පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුවේ. |
| (ආ) | සමථ මණ්ඩල කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට තනතුරු 07 ක කාර්ය මණ්ඩල පුරප්පාඩු 161 ක් පැවතුණි. පුරප්පාඩුව පැවති ලේකම් තනතුරට 2017 ජූනි 12 දින සිට කොන්ත්‍රාත් පදනම මත රාජකාරී ආවරණය කිරීමට නිලධාරියෙකු බඳවාගෙන තිබුණි. | මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය සේවා,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත. | -එම- |
| (ඇ) | ජාතික ඒකාබද්ධතා අංශයේ තනතුරු 04 ක කාර්ය මණ්ඩල පුරප්පාඩු 04 ක් පැවතුණි. | 2020 පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් පසු ජාතික ඒකාබද්ධතාවය හා ප්‍රතිසන්ධානය පිළිබඳ අංශයේ කාර්ය මණ්ඩලය අධිකරණ අමාත්‍යාංශයේ ජාතික ඒකාබද්ධතා අංශය හා බන්ධනාගාර කළමනාකරණ සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශය අතර බෙදා වෙන් කිරීමේදී මෙම පුරප්පාඩු ඇතිවී ඇති අතර මේ වන විට එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. | -එම- |